# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1805/2 – 2013 අප්‍රේල් 08 වැනි සඳුදා – 2013.04.08

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහනුවර දකුණ ජලසම්පාදන ක්‍රමයේ සක්කරංකොටුව මවුන්ට් ටේම්පල් ජලටැංකිය ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර ඉහළ කෝරළේ මවුන්ට්ටෙම්පල් ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මැනුම්පති විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 320052(3)14 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 123 ප්‍රමාණයෙන් හෙක්. 0.0039ක් වන මවුන්ට් ටෙම්පල් වත්ත නැමැති ඉඩම.

01. **කැබලි අංක 123**
ඉඩමේ නම: මවුන්ට් ටේම්පල් වත්ත; හිමිකම් කියන අය: ඒ. ඒ. පොඩිරාළහාමි, තුෂාර ස්ටෝස්, කඩුගන්නාව පාර, ගම්පොල; ප්‍රමාණය: හෙක්. 0.0039.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජුනි මස 24 වැනි දින පූ. භා. 09.30 ට උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජුනි මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බී. එම්. නිමල් බාලසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත ගම්පොළ.

මගේ අංකය: ඩීඑස්/යූපී/3/1/එල්ඒකිව්/සකරන්. ටැන්ක්/40.
ඔබේ අංකය: 4/3/3/2010/ඩබ්එස්/249.
2013 අප්‍රේල් මස 04 වැනි දින,
උඩපළාත ගම්පොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 657

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: කි/ඉ/ 01/03/10.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරින්ද මගින් ඉහළ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිරින්ද මගින් ඉහල



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ගමේ මූලික පිඹුරු අංක මාර/1856 හි පත්‍රය 91/9 සහ 91/8 අතිරේඛය 91/1/1 සහ 91/9/2 හි පහත දැක්වෙන ඉඩම් කැබැලි.

**කැබලි අංක 1**
ඉඩමේ නම: අඹගහමුලන; විස්තරය: විවෘත මඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0115.

**කැබලි අංක 2**
ඉඩමේ නම: පිං කැල්ල; විස්තරය: විවෘත මඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0250.

**කැබලි අංක 3**
ඉඩමේ නම: ගුරුගොඩමුලන; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්. 0.0282.

**කැබලි අංක 4**
ඉඩමේ නම: ගුරුගොඩමුලන; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0065.

**කැබලි අංක 5**
ඉඩමේ නම: ගුරුගොඩමුලන; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්. 0.0040.

**කැබලි අංක 6**
ඉඩමේ නම: ගුරුගොඩමුලන; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0200.

**කැබලි අංක 7**
ඉඩමේ නම: නැබියගොඩැල්ල; විස්තරය: කුඹුර සහ පාර; ප්‍රමාණය: හෙක්. 0.0332.

**කැබලි අංක 8**
ඉඩමේ නම: අඹගහමුලන; විස්තරය: කුඹුර ; ප්‍රමාණය: හෙක්. 0.0130.

**කැබලි අංක 9**
ඉඩමේ නම: පිං කැල්ල; විස්තරය: විවෘත මඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0170.

**කැබලි අංක 10**
ඉඩමේ නම: අම්පිටිය වත්ත; විස්තරය: විවෘත මඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0215.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජුනි මස 10 වැනි දින පූ. භා. 09.00 ට කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජුනි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

චින්තක අබේවික්‍රම,
ප්‍රාදේශීය ලේකම්,
කිරින්ද-පුහුල්වැල්ල.

2013 ජනවාරි මස 11 වැනි දින,
කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 658

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.